# නිර්මාණ Nirmana

## මේ ඒ සඳ ද?

සෝකී සුසම් ගම රට සිහිවී හෙලන
පාවෙයි ගණ අඳුර හා සීතල ගලන
නෑ කවුරුවත් නෙත ළඟ හඳුනන කියන
මේ ඒ සොඳුරු ලන්ඩනයද ඔබ පිනන

ගහ කොළ සුසුම් ලන සීතල පහර විඳ
මට ඇහෙනවා මේ තනිකම අඳුර බිඳ
සිතියම් පොතේ හැඩරුව ගත් කඳුළු බිඳ
මව්බිම මගේ තවමත් එහි තියන වද?

දිවයින කුහුඹු ජන මාවත් හතර අත
නිම නැත හිම කබා පෙරහර සතර අත
තන යුග කොකුමහර පිස එන පවන නැත
සිංහළ කමක් දහළයි සුදු පොළව මත

නැත හිරු එළිය දුටු දවසක් ඇස නිවන
එනමුත් සඳකි සුපුරුදු හඳුනන කියන
මා දෙස බලා හිනැහෙයි ලෙන්ගතු ලෙසින
මේ ඒ සඳ ද මගෙ සා පැටවුන් නිදන

සඳ යාළුවේ මගෙ දුක අහගෙන ඉන්න
හෙට ගම්දොරට ගොස් මා ගැන පව සන්න
තරු කැටයක හොරෙන් කාටත් නොපෙනෙන්න
කවියක් එවනවද මගෙ පාළුව යන්න!

ඉරිදා දිවයින ප්‍රධාන කතෘ
♦ ගාමිණී සුමනසේකර
ලන්ඩනයේදී



## නත්තල දිලේවා !

පැල්පත් මුදුනෙ හැම රන්තරු දිලීයන්
කිතු හිමි සමගමය නත්තල දැනීයන්
හොඳ හිත මගින් සාමයෙ සෙත සැදීයන්
හැම හිස මතම නත්තල් මල් පිපීයන්

ගවහල සරසවියෙ ඉගෙනුම ලැබේවා
උගතුන් තුන් දෙනා මෙන් වැඳ වැටේවා
රන් තුවරලා මෙන් හොඳ හිත සැදේවා
අරුතක් නොමැති නත්තල ඇති නොවේවා

බේබදු නාටකට කරළියෙ නොවේවා
සහජීවනය කළ එළියේ පෙනේවා
හිස් ගති බබලනා ගති මතු නොවේවා
නත්තල් බැලුන් මෙන් මිනිසුන් නොවේවා

හදවත නමැති විමනේ දොර ඇරේවා
කිතු සමිඳුනට එහි ඉඩකඩ ලැබේවා
නව දිවියකට නව අඩිටන් ගැනේවා
මේ නත්තලට ආසිරි වැසි වසීවා

සමගිය සමග සොම්නස හද බැදේවා
අතිනත ගෙන වෙසෙන්නට හිත හැදේවා
බෙදනා වැට තියර පවුරුද බිදේවා
නවයුගයකට නත්තල මුල පිරේවා

හැම හැම හිතම යහපතටම හැරේවා
දහමට නතුව හැම මොහොතම ගෙවේවා
සාමයෙ දූතයෙකු වී පිය නැගේවා
වසරේ හැම දිනම නත්තල දිනේවා

♦ ගරු මොල්ලිගොඩ
මෝසස් පෙරේරා පියතුමා

## Miracle on Christmas Day

A bright Christmas star
sits high on a tree
shining its light
for the whole world to see

reminding us all
of a night long ago
when a star in the sky
guided wise men below

to a small town stable
where a gift from above
was born on that night
to bring the world love.

The light from the star
shone down on a child
asleep in the manger
so meek and so mild.

Shepherds and wise men
who came to draw near
then spread the good news
that the saviour is here.

Now the Christmas tree star
still leads us today
to the birth of a miracle
that first Christmas day.

♦ Tom Krause

## අම්මා එන තුරු

ලස්සන කතා රස කර කර අසන්න ට
රසකර උයා දෙන ආහර බුදින්න ට
කරුණා සිහිල් ගුණයෙන් හද පිරෙන්න ට
එනවද අම්මෙ නැවතත් අප දකින්න ට

නොකියා මෙමට ඔබ අප හැර ගිය ගමන
සිටියා වෙන් ඔවුන් මා හා වී උරණ
විඳගන්නට බැරිය තවමත් හද රිදෙන
අම්මේ ඔබයි මා දිවි එළි කළ පහන

බැරි වුණ අඩු පාඩු පුරවා දමන් නට
මග හැරි අවවාද යළි පිළිපදින්න ට
වැරදුණ ජීවිතය යළි ගොඩ නගන්න ට
අම්මේ හැකිද යළි අප වෙත වඩින්න ට

සිසිලක් හදවතට දුන්නේ ඔබ පමණී
දිරියක් සිත තුළට දැම්මේ ඔබ පමණී
ජීවත් වෙන්න එඩි දුන්නේ ඔබ පමණී
දරු හදවතට පෙම දුන්නේ ඔබ පමණී

සැඳෑ අඳුර වටින් ගොඩින්
එබී බලන විට වත්තේ
ඔබ සිටියා කුහුල් සිතින්
දුක් පුරවාගෙන චිත්තේ
අකුරට ගොස් මා එනතුරු
ශෝක සිතින් එළිපත්තේ
සිටියා මෙන් මමත් සිටිමි
ඔබ කොහිදැයි දැන් ඇත්තේ?

♦ මධුරි අබේවික්‍රම
Harrow UK

## සාම්පූර් පහන්කණුව

ජය පැන් කුසලානය
හලා මහ මුහුදට
යුද්ධයෙ සාපීය කඩුතුඩින්
ගත පුරා කැපුම් කෙටුම් ලත්
නායක සෙන්පතිඳු.

නුඹේ කඳුළු බිඳු දැක්කෙමි
දෙපා මුල මුහුදේ
රළගෙඩි හා එක්ව
වීර පුරන් අප්පු වගේ
අන්තිම වෙඩි පහරත්
හිටගෙනම විඳ
ඉතිරි වූ පණ පොදින්
නොවැටී තවමත්
තේජස නම්
කිහිළිකරු වාරුවෙන්
මේ නැගී සිටින්නේ

මුතූර් ජැටියෙන් ගොඩ වී
ත්‍රිකුණාමල වරායෙන් නැව් නැග
එතෙර වන්නට නොව මුහුදු සතෙන්

කඩතොලු වූ කශේරුවෙන්
කඳුළු පිරි දැසින්
කැළැල් වූ පපුවෙන්
උපේක්ෂාබර බැල්මෙන්
මේ කල්පනාකරන්නේ
නිට්ඨාවට සුව වී
යළිත් තේජමාන වී
සළසන්නට නොවෙද යහපත
බැබළී එදා මෙන් ආඩම්බරයෙන්


සාම්පූර්
පහන් කණුව

♦ මහින්ද ප්‍රසාද්
මස්ඉඹුල
ගොඩකවෙළ Sri Lanka

## අහිමි නුඹට

විඩාපත් ගත වැළඳ
සිසිලසක් ගෙන දෙන්න
අනේ මා මඳ පවන වුණා නම්

කවුළුවෙන් එබෙන්නට
එළිය බිඳුවක් දෙන්න
අනේ මා සඳ කිරණ වුනානම්

දෙතොල් පෙති මත හිඳින
සිත සතුට විඳගන්න
අනේ මා හසරැල්ල වුණානම්

කොපුල්තල සිපගන්න
සිතේ දුක විඳගන්න
ගලායන කඳුළු බිඳ වුනානම්

දොඩමලුව දෙඅත් බැඳ
මාවතේ පියමැන්න
ඒ යුගය යළිත් පැමිණෙනව නම්

නොවී ඔය හිත චපල
නොදී මට මේ ගින්න
අනේ නුඹ මටම හිමි වුණානම්!

♦ මධුරි රත්නායක
UK



## මුල් පිට කවිය වෙනුවෙනි

ලංකාවිත්ති මුල් පිටුවක වූ කවිය
පියෙකුගෙ ගෙළ වෙලුණු ඒ සුරතල් දැරිය
මගෙ සිත තුටින් පිරවුණී එය දුටු දිනය
මේ තුති පිරි නමමි එය හරි අගනේය

ඉඩ නැති වුනත් ඉන්නා මගෙ පරිසරයේ
නොයෙකුත් පොත් කබල් තිබෙනව කාමරයේ
පිය සෙනෙහසට දුක උරුමය ජීවිතයේ
ඒ මුල් පිට දිලෙයි දැන් මගෙ කාමරයේ

♦ හෙක්ටර් ගුණරත්න
London N22

## ආදරණීය අම්මාට!

දස මස කුස හොවා මෙලොවට බිහි කෙරුවා
ලේ කිරි කර පොවා කුසගිනි නැති කෙරුවා
ගුණදම් කියා දී යහමඟ හෙළි කෙරුවා
සිප් සත පොවා මා හොඳ මිනිසෙකු කෙරුවා

හොඳින් ඉගෙනගන්නට දිරි දුන් අම්මේ
එයින් මුදල් උපයමි මම් අද අම්මේ
පෙවූ යහ ගුණෙන් හරි මග ම ය යන්නේ
මතුත් මගේ මව වී උපදින් අම්මේ

ඔබ ගැන සිතන හැම මොහොතක් පාසාම
පින් දෙමි ඔබට මෙහි මා නොවරද වාම
කරගත නොහැකි මුත් ළඟ සිට සැලකීම
දිගු ආයුෂ පතමි අම්මේ හැමදාම

ඉල් මාසයේ පසුවුණු දාහත් වෙනිදා
ඔබගේ ජන්ම දිනයයි මතකද මන්දා
ළඟටම ඇවිත් සුබ පතනට බැරි හින්දා
පැතුමක් මෙසේ අමුණමි කඳුලැලි රන්දා

♦ චන්දන ගුණසේකර Watford UK

### ලංකාවිත්තියට ලිපි එවන විට මතක තබාගන්න!

ලංකාවිත්තියට ලිපි හා කවි එවන විට ඔබේ හරි නම සහ ලිපිනය ලියා එවන්න. ලිපිනය අප පත්‍රයේ පළකරන්නේවත්, වෙන කාටවත් දෙන්නේ වත් නැති බව මතක තබාගන්න. ආරූඪ නම් වලින්, බොරු නම්වලින් හෝ නම් කෑලිවලින් හෝ නිකම්ම UK යනුවෙන් රටේ නම පමණක් ලියා එවන ලිපි හෝ කවි අප පළකරන්නේ නැත. ඒවායේ අඩංගු දෑ කොපමණ හොඳ උසස් ගණයේ වුවත් ඒවා කෙළින්ම යන්නේ කුණු කූඩයට බව කරුණාවෙන් සලකන්න.

\- කතෘ

## ළමා ලොව

පුතුගේ පොඩි දෝනි සුරතල් මල් කැකුලක්
සැදුවේ ඒ දුවට කුරුම්බැට්ටී මැසිමක්
සුදු පුතු හඩයි ඔහුටත් ඕනැලු යමක්
පොල් කටු අං ගසා සැදුවා ඔහුට ගොනෙක්

ලොකු පුතු හට දුන්නා යකඩ රෝදයක්
පොල්පිත්තෙන් කරකවා දුවයයි රවුමක්
අක්කට දුනිමි උයනට වැලිවලින් බතක්
පුංචි පවුලෙ සෙල්ලම්ගේ හරිම හැඩක්

පොල්ගස් රුප්පෙ වත්තේ අග තණ නිල්ලේ
සෙල්ලම් කරති සැම හිඳගෙන සෙව නැල්ලේ
පදිනව හැමදෙනා ඔංචිලි විල්ල මලේ
බලන්නට යසයි කරනා දඟ එවෙලේ

දුවයයි උදැසන සෙල්ලම් ගේ වෙතට
හඩමින් දුවයි නැවතත් අම්මා වෙතට
වහලා කූඹි අම්මේ මගෙ බත් එකට
පොල් කුඩු නිසයි ආවේ කූඹි එතනට

♦ රත්නාවලි කුමාරි දිසානායක
Hounslow Middx UK

## එදා - අද

පිහාටුවක් පුළුන් රොදක්
පිඹ පිඹ ඉහළට යවමින්
පුංචි කාලෙ ලැබුව සතුට
අමතක වී නෑ

පොල් කට්ටට වැලි පුරවා
කෝම්පිට්ටු අපි හැදුවා
කෝම්පිට්ටු කවි තාමත්
හිතෙන් ගිහින් නෑ

පුවක් කොළපතේ ඉඳගෙන
ගිය හැටි කාටද අමතක
වැටුණ දාට බැනුමක් නම්
වැරදුණේම නෑ

තරඟෙට අඹ ඇට පැන්නා
එල්ලේ ගහලා දින්නා
හැමදාමත් ගුඩු ගැහුවා
ඇතිවුනේ ම නෑ

ඔංචිලි විලි විල්ල මලේ
නැල්ල දිගට නෙල්ලි කැලේ
උඩ අත්තේ ඔංචිල්ලෙට
නිවාඩුවක් නෑ

රූපවාහිනී නැතුවට
මොන සතුටක් අපි ලැබුවද
අද කාලේ හුඟක් ළමයි
ඒක දන්නෙ නෑ

♦ ශ්‍රීපාලි කොටුවැල්ල
CA USA

## පිළිසරණ

කඳුළු ගඟුල නෙතු ඉමේ
දෙගොඩ තලා ගිය දිනේ
උණ පඳුරක් වී මග අවුරා
නුඹ මා සනසාලූ

සුළි සුළඟින් අතු සිඳී
දුබල හඬින් ඉකිබිඳී
මඳ පවනක් වී ගී මුමුණා
නුඹ මා සනසාලූ

හුදකලාව තනි රැකී
ගිලන් සිතක ඉව දැනී
සිතුවිල්ලක් වී සුවඳ දිදී
නුඹ මා සනසාලූ

හිමිව තිබී පෙර බවේ
අහිමි වුවද මේ බවේ
සෙවනැල්ලක් සේ සංසාරේ
නුඹ මා සුරැකීලූ

♦ ශ්‍රියා කුමාරසිංහ
New Zealand

## මිලිනව ගිය සුවඳ මල

මගෙ ජීවිතේ ලස්සන
කළ එකම මල
අම්මේ ඔබයි ඒ
සුපිපුණු සුවඳ මල
මගේ දෙනුවනට
හිමිකරලා කඳුල
මිලිනව ගියේ ඇයි
ඒ ගුණ සුවඳ මල

කේ. ඒ. ඉන්ද්‍රා රංජනී
Jordan

## කුළුඳුල් මුනුපුරාට

සුවහස් පැතුම් පොදි බැඳ හද තුළ හංගා
කල් යල් බලා සිටියෙමි එනතුරු රුංගා
මෙහි වැඩි කුමරුනේ දෙව්ලෝකෙන් රිංගා
දෝතට වඩමි මම් දුරු කර සිත සංකා

සේපාලිකා අරලිය ගැට පිච්ච ඉතී
හමනා සුළං සමගින් හද කවන කිතී
කොවුලනි කුරුල්ලනි ඔබෙ ගී ඇහුණ ඇතී
ඒ කිසිවක් එපා පුතු පමණක්ම ඇතී

මොළකැටි බවින් කිරි
සුවඳින් පිරුණු මුවේ
අසිරිය නිවා දුක
ගෙන එයි සිතට සුවේ
ඔබ නම් මලක්මය
සුවඳින් පිරුණු ලොවේ
සමුගෙන ඔබෙන් මට
දැන් යා හැකිද නොවේ

♦ චන්ද්‍රා මාලිනී විජේසූරිය
Paris France